www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප මැතිවරන රැස්වීමක් කොලඹ දී

## Sri Lankan SEP to hold election meeting in Colombo

**2009 මාර්තු 18**

බස්නාහිර පලාත් සභා මැතිවරනයේ දී කොලඹ දිස්ත්‍රික්කය සඳහා ගෙන යන සිය උද්ඝෝෂනයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප), මාර්තු 24 දා ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

කතිකයෝ වැඩ කරන ජනතාව මුහුන පා සිටින කේන්ද්‍රීය ගැටලුවලට ආමන්ත්‍රනය කරනු ඇත: එනම්, දෙමල සුලුතරයට එරෙහි ආන්ඩුවේ සාපරාධී යුද්ධය ද සමස්තයක් ලෙස කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ජීවන මට්ටම් මත එල්ල කෙරෙන නොනවතින ප්‍රහාරය ද අවසන් කරන්නේ කෙසේද යන ගැටලුවලට ආමන්ත්‍රනය කරනු ඇත.

මිලිටරිය උතුරේ ගෙන යනු ලබන ක්ෂමාවිරහිත යුද්ධය මගින් සිවිල් වැසියන් සිය ගනනින් ඝාතනය කරනු ලබන අතර දිවයින පුරා වැඩ කරන ජනතාව දොට්ටදැමීම්වලට, අත්‍යවශ්‍ය සේවා කප්පාදුවට සහ වැටුප් හා සේවා කොන්දේසි පිරිහීමට මුහුන දී සිටිති. යුද්ධය ද 1930 ගනන්වලින් මෙපිට පැවති දරුනුතම ගෝලීය ආර්ථික පසුබැස්ම ද මගින් නිර්මානය කෙරෙන ගැඹුරු වන ආර්ථික අර්බුදයේ බර කම්කරු පන්තියේ කර මත හෙලිය යුතු බවට ආන්ඩුව සහ විපාර්ශ්වයේ පක්ෂ සියල්ල එකඟ වී තිබේ.

මොන යම් හෝ විරුද්ධත්වයක් නිහඬ කරනු පිනිස පොලිස්-රාජ්‍ය විධික්‍රම, වඩවඩා යොදා ගනු ලැබේ. මාධ්‍යවේදීන් හා දේශපාලනඥයන් ඇතුලු සිය ගනනක්, ආන්ඩුවට ගැති ඝාතක කල්ලි විසින් පැහැරගෙන යනු හෝ ඝාතනය කරනු ලැබ ඇත. විරෝධතා දක්වන සිසුන් සහ වර්ජක කම්කරුවෝ සතුරන් ලෙස සලකනු ලැබේ. යුද්ධයේ 25 වසරක කාලය මුලුල්ලේ වර්ධනය කෙරුනු දැවැන්ත රාජ්‍ය මර්දන උපකරනය සමාජ අසහනය මඩිනු පිනිස මෙහෙයවනු ලැබේ.

සසප, ධනවාදය හා එහි දේශපාලනඥයන් විසින් නිර්මානය කරනු ලැබ ඇති භයංකර තත්වයට එරෙහිව සිය සමාජවාදී හා ජාත්‍යන්තරවාදී විකල්පය විස්තර කොට, ආර්ථික හා දේශපාලන අර්බුදයේ ඓතිහාසික මූලයන් පැහැදිලි කරනු ඇත. එම රැස්වීමට සහභාගි වන ලෙස කම්කරුවන්ගෙන්, බුද්ධිමතුන්ගෙන් හා අපගේ සියලු ආධාරකරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු. ඔවුන්ගේ අනාගතය තීන්දු කරනු ඇති තීරනාත්මක ප්‍රශ්න සාකච්ඡා කරනු පිනිස මෙම අවස්ථාව උපයෝගී කරගන්නා ලෙස අපි තරුනයන්ට විශේෂ ආයාචනයක් කරමු.

**ස්ථානයඃ කොලඹ 7, මහජන පුස්තකාල ශ්‍රවනාගාරය**

**වේලාවඃ මාර්තු 24 වන අඟහරුවාදා සවස 4.00ට**

© www.wsws.org